රඹුක්කන ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

.........................................

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 22 සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා සබරගමුව පළාත් සභා වෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.9,205,102 ක් ගිණුම් වලට ගෙන නොතිබුණෙන් වර්ෂයට අදාල අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2014 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාලව මුද්දර ගාස්තු වලට අදාල උපලේඛන ලැබී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත ආදායමක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණෙන් සමාලෝචිත වර්ෂය තුළදී ඉකුත් වර්ෂය වෙනුවෙන් ලද රු. 8,045,307 ක් වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) දේශීය ණය හා සංවර්ධන අරමුදල සඳහා ඉකුත් වර්ෂයට අදාල පොලිය රු.1,033,637 ක් සමාලෝචිත වර්ෂයේ පොලී වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ 2012 අවසන් කාර්තුවට අදාලව ගෙවිය යුතු පොලිය වූ රු.558,588 ක් ගිණුම්ගත කර නොතිබුණෙන් සමුච්චිත අරමුදල සහ ගෙවිය යුතු ණය හිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

(ඊ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ හිඟ ණය වාරික සඳහා දඩ පොලී රු.29,532 ක් ගිණුම්ගත කර නොතිබුණෙන් වර්ෂයේ අතිරික්තය හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

(උ) 2014 වර්ෂයට අදාලව 2015 දී ගෙවීම් කරන ලද රු.65,824 ක විවිධ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 07 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.83,095,810ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.88,568,419ක් වූයෙන් වෙනසරු. 5,472,609ක් විය.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වෙනත් ආදායම් වලට අදාල ලැබිය යුතු ශේෂ වල වටිනාකම වූ රු. 8,834,978 න් සියයට 42 ක්,එනම් රු. 3,756,086 ක් වසරකට වඩා පැරණි විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට පැවති වියදම් ණයහිමි ශේෂය වූ රු. 3,250,034 වසරකට වඩා පැරණි විය.

1.3.4 <u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) 2005 දෙසැම්බර් 19 දිනැති අංක PED 33 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය | - | ආයතනයේ අතිරික්ත මුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීමේදී රජයේ බැංකු හරහා පමණක් ආයෝජනය සිදුකළ යුතු බව අවධාරණය කර තිබියදී එයට පටහැනි ලෙස 2006 අගෝස්තු 22 දින රු. 100,000 ක මුදලක් “First capital” නැමති පෞද්ගලික නියෝජිතයකු හරහා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට එකී ආයෝජනය රු.232,879 ක් විය. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ අතුරු ව්‍යවස්ථාවේ 39 කොටසේ විධි විධාන | - | 2014 වර්ෂයේ සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර තිබූ ස්ථිර හා තාවකාලික නාම පුවරු වලින් ලේඛනගත කරන ලද නාම පුවරු 13 ක් හැර ඉතිරිය ගැන සොයාබලා අනවසර ප්‍රචාරක දැන්වීම් පුවරු හිමියන්ගෙන් හා ප්‍රචාරක ආයතන වලින් ගාස්තු අයකර ගැනීමට හෝ ඒවා ඉවත් කිරීමට . 2014 නොවැම්බර් 11 දින දක්වා කටයුතු කර නොතිබුණි |
| (ඇ) <u>සබරගමුව පළාතේ පළාත් සභාවේ මුල්‍ය රීති</u> 261.2.2 රීතිය | - | 2012 සහ 2013 යන වර්ෂයන්හි දී අවස්ථා 03 කදී ලබාගත් එකතුව රු. 112,103 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2015 අප්‍රේල් මස විගණන අවස්ථාව වන විටත් පියවා නොතිබුණි. |

283 රීතිය - එකතුව රු.77,226 ක් වූ නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් 56 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

මු.රෙ.571 - වසර දෙකේ සිට පහට වැඩි එකතුව රු.4,506,253 ක තැන්පත් ආදායමට ගෙන නොතිබුණි.

මු.රෙ.1146 - සභාව සතු වාහන 11 කට අදාලව 2014 වර්ෂයේ මාර්තු සිට සැප්තැම්බර් දක්වා කාලයට අදාල ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු. 14,642,635 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු18,006,363 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය තුලමූල්‍ය ප්‍රතිඵලයරු 3,363,728 ක අඩු වීමක් පෙන්නුම් කෙරින.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,363,728 ක පිරිහීමකට ආදායම් විෂයයන් 03 ක අඩුවීම හා වියදම් විෂයයන් 05ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයටඅදාලවඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා සමුච්චිත හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.01.01දි නට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල් කිරීම් | දිනට හිගය 2014.12.31 වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිගයෙන් අයවීම | වර්ෂයේ බිල් කිරීම් වලින් හිහය | මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු . | රු. | රු. | රු. |
| iවරිපනම් හා බදු | 3,056,270 | 1,667,894 | 5,425,697 | 4,154,628 | 1,388,376 | 971,069 | 2,359,445 |
| ii බදු කුලී | 565,714 | 387,556 | 6,486,396 | 6,016,921 | 178,158 | 469,475 | 647,633 |
| iiiබලපත්‍ර ගාස්තු | 684,000 | - | 2,676,822 | 2,651,054 | 684,000 | 25,769 | 709,769 |
| Ivවෙනත් ආදායම් | 5,203,197 | - | 66,452,491 | 64,294,484 | 5,203,197 | 2,158,007 | 7,361,204 |

2.3.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවිදඩ | 2,812,501 |
| (ii) මුද්දර ගාස්තු | 9,205,102 |

2.3.3 <u>දැන්වීම් පුවරු ගාස්තු</u>

ස්ථිර දැන්වීම්පුවරු 04 ක් සහ තාවකාලික දැන්වීම්පුවරු 01 කින් රු.66,600 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරනොතිබුණි.

2.3.4 <u>අක්කර බදු</u>

2014 ජනවාරි 01 දිනට අක්කර බදු හිඟ ශේෂය රු.127,388 ක් වූ අතර 2014 සැප්තැම්බර් 30 දිනවන විට හිඟවලින් අයවී ඇති ප්‍රමාණය රු.21,174 ක් එනම් 16.62% ක ඉතා අඩු ප්‍රතිශතයක් විය. බදුකරුවන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,207 ක බද්දක් වසර 08 ක සිට හිඟහිටිව පැවතුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයට අදාලව ඉඹුල්ගස්දෙනිය පුස්තකාලයේ ඌනතා පොත් වටිනාකම රු. 80,073 ක් හා 25% ක දඩ මුදල ඇතුළුව අය කළයුතු මුළු වටිනාකම වූ රු.100,091 ක් විගණන දිනය වූ 2014 නොවැම්බර් 11 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 සිට ගිණුම් වල අවල වත්කම් යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු රු.200,000 ක ශේෂයක් දිගින් දිගටම ගිණුම් වල හෙළිදරව් කර තිබුණු අතර, එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පින්නවල පොදු වැසිකිළිය වෙනුවෙන් මුදල් කවුළුවක් තැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.328,455 ක් වැය කර තිබුණද 2015 මැයි දක්වාම මුදල් අයකිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

3.2 <u>අවිධිමත් ගනුදෙනු</u>

2014 නොවැම්බර් 17 දින රු.469,928 ක් වටිනා කොඩිකණු 424 ක් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලබාදී තිබුණි. කොඩිකණු 319 ක් සභා භූමියේ රඳවා තිබුණ අතර, රු.36,574 ක් වටිනා කොඩිකණු 33 ක් දේශපාලන පක්ෂවල ශාඛා සමිති වලටද රු.79,799 ක් වටිනා කොඩිකණු 72 ක් අස්ථානගතව ද පැවතුණි. මෙම භාණ්ඩ ලැබීම් මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත්හි සටහන් කර නොතිබුණ බව 2015 මාර්තු 23 දින සිදු කරන ලද භෞතිකපරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

04. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

<u>අයවැය පාලනය.</u>

2014 අයවැය ලේඛනය මඟින් වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදන වලින් අවස්ථා 24 කදී එකතුව රු.2,297,000 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබුණු අතර, වැය විෂයන් 09 කට අදාලව

එකතුව රු.623,346 කින් ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.මේ හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි මුල්‍ය පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

05. පද්ධති හා පාලන

පහතසඳහන්පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත්පාලනය